SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර II විභාගය - 2023 ජනවාරි

# යෝජිත උත්තර

# (203) ව්‍යාපාර නීතිය (BLA)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන: 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර II විභාගය - 2023 ජනවාරි**

# (203) ව්‍යාපාර නීතිය

# යෝජිත උත්තර

(මුළු ලකුණු 25) **A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

**1.1** (2)

**1.2** (3)

**1.3** (2)

**1.4** (4)

**1.5** (2)

**1.6** (4)

aat SRI LANKA

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 12)***

**1.7** (සත්‍ය)

**1.8** (සත්‍ය)

**1.9** (අසත්‍ය)

***(එක ලකුණු 01 බැගින් මුළු ලකුණු 03)***

**1.10** කැමැත්තේ විත්තිවාචකය යනු වරද සිදු වීමට පෙර අදාල බලධාරීන්ට අනුමැතිය ලද හෙලිදරව් කිරීම සිදු කර ඇත්තා වූ සහ ගනුදෙනුව සඳහා කැමැත්ත ලබා ගෙන ඇත්තා වූ අවස්ථාව වේ.

**1.11 නෞභාර පත්‍රයේ වැදගත්කම (පහත කරුණු වලින් කවර හෝ දෙකක් (2)**

1. නෞකාගත කරන ලද භාණ්ඩ සඳහා රිසිට්පතක් වශයෙන් කටයුතු කිරීම
2. නැව් කුලී ගිවිසුම පවතින බවට වන සාක්ෂියක් ලෙස පැවතීම
3. හිමිකම් තහවුරු කරන ලේඛනයක් වීම

**1.12 චෙක්පතක පිටසන් වර්ග**

1. සාමාන්‍ය පිටසන
2. විශේෂ පිටසන

**1.13 භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ගැණුම්කරුවෙකුට පවතින ප්‍රතිකර්මයන්**

1. භාණ්ඩ භාර නොදීම සඳහා වන පියවරයන්
2. නිරූපිතව ඉටු කරවා ගැනීම
3. මුදල නැවත අය කරවා ගැනීම
4. කොන්දේසි කඩ කිරීම හේතුවෙන් භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීම
5. ප්‍රතිඥාභාරයන් කඩ කිරීම හේතුවෙන් හානි ඉල්ලා සිටීම

**1.15 වර්ෂ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතු සමාගම් වර්ග**

1. සීමිත සමාගම්
2. සීමිත නොවන සමාගම්
3. ඇපයෙන් සීමිත සමාගම්

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10)***

***(මුළු ලකුණු 25)***

***A කොටසෙහි අවසානය***

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 08 - රක්ෂණ නීතිය කුලී සින්නක්කර සහ කල් බදු***

**(a) කුලී සින්නක්කර ගිවිසුමෙහි ගැණුම්කාර පාර්ශ්වය ලෙසින් ,නිමල් සතුව පහත යුතුකම් පවතී.**

- කුලී සින්නක්කර ගිවිසුමමට අනුව කටයුතු කිරීම
එකඟවූ වාරික ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් නිමල් මෙම යුතුකම කඩ කර ඇත.

- භාණ්ඩ ආරක්ෂා කිරීම
හදිසි අනතුර සිදු වූයේ නිමල්ගේ නොසැලකිල්ල හේතුවෙන් නම්, නිමල් වාහනය නිසි ලෙස ආරක්ෂා කර නොමැත.

- භාණ්ඩ තිබෙන ස්ථානය සහ ආකාරය හිමිකරුට දැනුම් නොදීම
වාහනය නවතා තැබීම සඳහා ගත් උත්සාහයේදී ශ්‍රී ලක් එන්ටර්ප්‍රයිසස් නියෝජිතයන්ට වාහනය තිබෙන ස්ථානය දැනුම් දීමට නිමල්ට යුතුකමක් පවතී.

- වංචනික භාණ්ඩ විකුණුම් හෝ බැහැර කිරීම මගින් භාණ්ඩවල හිමිකරු රැවටීම හෝ වංචා කිරීම සිදු නොකිරීම
මිල ඉහල යාමේ වාසිය ලබා ගැනීම සඳහා තුන්වන පාර්ශ්වයකට වාහනය නැවත විකිණීමට උත්සාහ කිරීම මගින් නිමල් ඔහුගේ යුතුකම් කඩ කරනු ලබයි.

**කුලී සින්නක්කර ගිවිසුමෙහි ගැණුම්කාර පාර්ශ්වය ලෙසින් නිමල් සතුව පහත වගකීම් පවතී.**

- කුලී සින්නක්කර ගිවිසුම කල් ඉකුත් වන තෙක් නොසිට භාණ්ඩ මිලදී ගැනීම
සම්පූර්ණ මුදල ගෙවීමෙන් අනතුරුව කවර හෝ අවස්ථාවකදී වාහනයේ හිමිකාරීත්වය ලබා ගැනීමට සහ ඉන් පසුව තුන්වන පාර්ශ්වයකට වාහනය විකිණීමට ඇති අයිතිය නිමල් රඳවා තබා ගනී.

- කවර හෝ අවස්ථාවකදී ගිවිසුම අවසන් කිරීමට

- කුලී ගැණුම්කරුට එකම හිමිකරු සමග කුලී සින්නක්කර ගිවිසුම් එකකට වඩා පවතින විටදී කුලී සින්නක්කර ගිවිසුම සඳහා වන ඔහුගේ ගෙවීම් අනුයෝජනය කිරීම සාමාන්‍ය වශයෙන්, මෙමගින් ඔහු සුදුසු යැයි සිතන්නා වූ ගිණුමකට ගෙවීම් සිදු කරවා ගැනීමට ගැනුම්කරුට ඇති අයිතිය දක්වනු ලබයි.

- ගිවිසුමේ පවතින ඔහුගේ අභිරුචීන් පැවරීමට

- හිමිකරු විසින් භාණ්ඩයක් නැවත අත්පත් කර ගැනීමේදී ඉතිරි වන කවර හෝ වැඩිපුර මුදලක් නැවත අය කරවා ගැනීමට සහ එය විකිණීමට
ශ්‍රී ලක් එන්ටර්ප්‍රයිසස් විසින් වාහනය නැවත අත්පත් කරගැනීමෙන් අනතුරුව වෙනත් පාර්ශ්වයකට විකුණනු ලැබුවේ නම් ශ්‍රී ලක් එන්ටර්ප්‍රයිසස් වෙත ගෙවිය යුතු වන මුදල අඩු කිරීමෙන් අනතුරුව ඉතිරි මුදල සඳහා නිමල් හිමිකම් කියනු ලබයි.

***(ලකුණු 05)***

aat SRI LANKA

**(b)** ගැණුම්කරු විසින් වාරිකය ගෙවීම පැහැර හරිනු ලැබූ විටකදී හෝ ගිවිසුම උල්ලංඝනය කරනු ලැබූ විටකදී ගිවිසුම අවසාන කිරීම සඳහා කුලී සින්නක්කර ගිවිසුමක හිමිකරුට අයිතිය ඇත. හිමිකරුට ගැණුම්කරු විසින් අත්තිකාරම් ලෙස පෙර ගෙවුම් කරන ලද වාරිකය සහ තැන්පතුව රඳවා තබා ගැනීම, භාණ්ඩවල භුක්තිය නැවත ලබා ගැනීම සිදු කළ හැකි අතර සිදුව ඇති කවර හෝ හානියක් සඳහා වන්දි අය කර ගනිමින් ඔහුගේ අයිතිවාසිකම් සහ වගකීම් වෙනත් පාර්ශ්වයකට පැවරීම සිදු කළ හැකිය.

නිමල් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ශ්‍රී ලක් වෙත වාහනය නැවත ලබා ගැනීමට සහ ගිවිසුම උල්ලංඝනය කිරීම සඳහා නඩු පැවරීමට හිමිකම පවතී.

හිමිකරු පිටපත් ලබා දීමට සහ භාණ්ඩයන්ගේ තොරතුරු ගැණුම්කරුට ලබා දීමට බැඳී සිටී. එබැවින් කුලී සින්නක්කර ගිවිසුම සම්බන්ධ කවර හෝ තොරතුරු මෙන්ම ගිවිසුම් පිටපත්ද නිමල් වෙත ලබා දීමට ශ්‍රී ලක් බැඳී සිටී.

***(ලකුණු 05)***
***(මුළු ලකුණු 10)***

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 04 - නියෝජ්‍යත්ව නීතිය***

**(a)**

**- නියෝජිතයා විසින් ස්වකීය ප්‍රධානියාගේ අනන්‍යතාවය හෙළිදරව් කොට තිබිය යුතුය.**
නියෝජිතයා විසින් ඔහුගේ පුද්ගලික නාමය භාවිතා කොට ගිවිසුමට එළඹ ඇත්නම්, එබඳු ක්‍රියාවක් නිවැරදි කිරීමෙන් ප්‍රධානියා වලක්වනු ලැබේ.

### Keighly Maxted V Durrant

විශේෂිත මිලකට ධාන්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රධානියා විසින් නියෝජිතයෙකු නම් කර තිබිණි. නියෝජිතයා විසින් ධාන්‍ය මිලදී ගත් අතර නියම කරන ලද මිලට වඩා වැඩි මිලකට ඔහුගේ පුද්ගලික නාමය භාවිතා කරමින් ගිවිසුමට එළඹෙන ලදී. මෙම ගනුදෙනුව ප්‍රධානියා විසින් අපරානුමත කරනු ලැබුයේ වුවද, අධිකරණයේ මතය වූයේ නියෝජිතයා විසින් ඔහු වෙනත් අයෙකු වෙනුවෙන් කටයුතු කරන බව හෙළි නොකර ඇති බැවින් එබඳු ගනුදෙනුවක් අපරානුමත කිරීමෙන් ප්‍රධානියා වැලකෙන බවයි.

**-නියෝජිතයා විසින් ගිවිසුම ඇති කර ගනු ලබන අවස්ථාවේදී, ප්‍රධානියා සතුව ගිවිසුම්ක ශක්‍යතාවය තිබිය යුතුය.**

### Kelner V Baxter

හෝටල් සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා වන කර්තව්‍යන් ලබා දෙනු ලැබූ ප්‍රවර්ධකයෙකු ණය පදනම මත හෝටල් සමාගම වෙනුවෙන් සැලකිය යුතු තරමේ අඩු මුදලකට විස්කි තොගයක් මිලදී ගන්නා ලදී. හෝටල් සමාගම විසින් එය පසුකාලීනව භාවිතා කරන ලදී (ඉන් අදහස් කරනුයේ සමාගම එය පසුව අපරානුමත කළ බවයි) පසුකාලීනව, හෝටල් සමාගම බුන්වත් වන ලදී. විකුණුම්කරු විසින් විකුණුම් මුදල නැවත අය කරවා ගැනීමට ප්‍රවර්ධකයාට එරෙහිව ගොනු කරන ලද නඩුවේදී, අධිකරණය විසින් කියා සිටින ලද්දේ හෝටල් සමාගමට ප්‍රවර්ධකයා ගිවිසුමට එළඹුණු අවස්ථාවේදී ගිවිසුම්ක ශක්‍යතාවය නොපැවති බැවින් අපරානුමත කිරීමෙහි නෛතික බලයක් නොමැති බවයි.

කෙසේ වුවද, මෙම රීතියට ව්‍යතිරේඛයක් වර්ෂ 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි දක්වා ඇත. සමාගම් පනතට අනුව, ප්‍රවර්ධකයන් විසින් අනාගත සමාගමක් වෙනුවෙන් එළඹෙනු ලබන්නා වූ ගිවිසුම් වලංගු ගිවිසුම් ලෙසින් සලකනු ලැබේ.

**-අපරානුමත කිරීම වලංගු සහ නෛතිකමය වශයෙන් බලාත්මක කළ හැකි ගිවිසුම් සඳහා පමණක් අදාල වේ.**

Brook V Hook (1871) LR 6

මෙම නඩුවේදී නියෝජිතයා විසින් ගිවිසුම ඇති කරගැනීමේදී ප්‍රධානියාගේ අත්සන ව්‍යාජ ලෙසින් යොදා තිබුණි. ව්‍යාජ අත්සන් යෙදීම ගිවිසුම එතැන්හිදීම බල විරහිත කරන්නා වූ අපරාධමය කටයුත්තක් වන බැවින් අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ එබඳු ගිවිසුමක් අපරානුමත කළ නොහැකි බවයි.
වලංගු අපරානුමත කිරීමක ප්‍රතිඵලය වන්නේ ප්‍රධානියා ගිවිසුමෙන් පසුකාලීනව බැඳී සිටීමයි. එයින් අදහස් වන්නේ ඔහුගේ ගිවිසුම්ක වගකීම ගිවිසුමට ඇතුළත් වූ කාලය දක්වා දිවෙන බවයි.

**-නියෝජිතයා විසින් ගිවිසුමෙහි සියලු වැදගත් කරුණු ප්‍රධානියාට දැනුම් දිය යුතුය.**

නියෝජිතයා කරුණු වසන් කළ ගිවිසුමකට ප්‍රධානියා එකඟ වී සැඟවුණු කරුණු පසුව අනාවරණය වුවහොත්, ප්‍රධානියා මුල සිටම වගකීමෙන් නිදහස් වේ.

***(ලකුණු 06)***

**(b)**

ප්‍රධානියාගේ උපදෙස් ලබා ගත නොහැකි හදිසි අවස්ථාවකදී නියෝජිතයෙකු තම ප්‍රධානියා වෙනුවෙන් ගිවිසුමක් ඇති කර ගන්නා විට, අවශ්‍යතාවය මත පිහිටා නියෝජ්‍යත්වයක් නිර්මාණය වන අතර එවැනි අවස්ථාවක ප්‍රධානියා නියෝජිතයාගේ ක්‍රියාවන්ට බැඳී සිටී.

ඒ සඳහා පහත පූර්ව අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

**I. ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගැනීමට නොහැකි තරම් හදිසි තත්ත්වයක් පැවතීම.**

**II. එසේ ක්‍රියා කිරීමේ සැබෑ වාණිජ අවශ්‍යතාවක් තිබීම.**

**III. ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයා සද්භාවයෙන් කටයුතු කර ඇති වීම.**

**IV. නියෝජිතයාගේ ක්‍රියාව සාධාරණ හා විචක්ෂණ විය යුතුය.**

**V. ප්‍රධානියා ඊට පටහැනිව පූර්ව නිශ්චිත උපදෙස් ලබා නොදී තිබිය යුතුය.**

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

***හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

| ***පරිච්ඡේදය 05 - හවුල්කාරීත්ව නීතිය*** |
|---|

**(a)**

මෙම කරුණේදී, හවුල්කාරිත්වයට බලපාන සියලු දේ පිළිබඳ සැබෑ ගිණුම් සහ සම්පූර්ණ තොරතුරු ලබා දීම සඳහා වන හවුල්කරුගේ යුතුකම ජෙරී විසින් උල්ලංඝනය කර ඇත.

හවුල් ව්‍යාපාර ආඥා පනතේ 28 වැනි වගන්තියට අනුව සියලුම හවුල්කරුවන් හවුල් ව්‍යාපාරවල විනිවිදභාවය පවත්වා ගත යුතුය. හවුල්කාරිත්වයට බලපාන සියලුම දේවල සත්‍ය ගිණුම් සහ සම්පූර්ණ තොරතුරු ඕනෑම හවුල්කරුවෙකුට හෝ ඔහුගේ නෛතික නියෝජිතයින්ට ලබා දීමට හවුල්කරුවන් බැඳී සිටී. එක් හවුල්කරුවෙකු අනෙකුත් හවුල්කරුවන්ට තොරතුරු වසන් කිරීමෙන් අනිසි ලාභයක් ලබා ගන්නේ නම්, එය හවුල්කරුවෙකුගේ විශ්වාසනීය රාජකාරිය උල්ලංඝනය කිරීමක් වේ.

*Bently* v *Craven* යනු මේ සම්බන්ධව වැදගත් නඩු තීන්දුවක් වේ.

මෙම නඩුවේදී, හවුල්කාරිත්වය වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා හවුල්කරුවෙකු වෙත (Craven) පවරන ලදී. ඔහු තම පුද්ගලික භාවිතය සඳහා ඉතා අඩු මිලකට සීනි තොගයක් මිල දී ගත්

නමුත් එබඳු කිසිඳු තොරතුරක් හෙළි නොකොට, වෙළඳපල මිලට හවුල්කාරිත්වය වෙත විකුණන ලද සීනි ලබා දෙන ලදී. ඔහු මෙම ගනුදෙනුවෙන් පුද්ගලික ලාභයක් උපයාගෙන ඇති බවටත් තවදුරටත් ඔහු මෙම ගනුදෙනුවට අදාළ ප්‍රමාණවත් තොරතුරු අනෙකුත් හවුල්කරුවන්ට හෙළි කර නොමැති බවටත් අධිකරණය විසින් තීරණය කරන ලදී. එබැවින් ඔහුගෙන් ලාභයන් අයකර ගැනීමට හවුල්කාරිත්වයට හැකියාව ලැබුණි.

ලබා දී ඇති අවස්ථාව තුළ, ලැබෙන වට්ටම් සඟවා වත්මන් වෙළඳපල මිලට හවුල් ව්‍යාපාරයට ක්‍රිකට් පිති විකිණීමෙන්, අමීර් සත්‍ය ගිණුම් සහ සම්පූර්ණ තොරතුරු වෙනත් හවුල්කරුවන්ට ලබා දීමේ රාජකාරිය කඩ කර ඇත.

***(ලකුණු 04)***

**(b)**

මෙම අවස්ථාවේදී, අමීර් තමන් මිලදී ගත් මිලට වඩා සියයට හතළිහක් වැඩි මිලකට ක්‍රිකට් පිත්ත හවුල්කාරිත්වයට අලෙවි කරන ලදී. ඉහත විස්තර කර ඇති හවුල්කාරිත්ව නීතියේ සංකල්පවලට අනුව, හවුල්කරුවෙකු විසින් උපයාගත් රහසිගත ලාභ හවුල්කාරිත්වය වෙනුවෙන් ගිණුම්ගත කළ යුතුය. එබැවින් අමීර් උපයන ලාභයෙන් අඩක් ලැබීමට අසාර්ට අයිතියක් ඇත.

***(ලකුණු 04)***

**(c)**

පහත දක්වා ඇති අවස්ථා වලදී, හවුල්කාරිත්වය විසුරුවා හැරීමට අධිකරණයට නියෝග කළ හැකිය.

- හවුල්කරුවෙකු සිහිමද පුද්ගලයෙකු වශයෙන් පෙනී යාම
- හවුල් ගිවිසුමේ ඔහුගේ කොටස ඉටු කිරීමට හවුල්කරුවෙකු ස්ථිරවම අසමත් වීම.
- හවුල් ගිවිසුමට අගතියක් වන හැසිරීම් සම්බන්ධයෙන් හවුල්කරුවෙකු වැරදිකරු වීම
- හවුල්කරුවෙකු හවුල් ගිවිසුම කඩ කිරීම
- හවුල්කාරිත්වය පවත්වා ගෙන යා හැක්කේ පාඩු පිට පමණක් වීම
- අධිකරණය විසින් එය විසුරුවා හැරීම යුක්ති සහගත හා සාධාරණ බවට සිතීම

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 10)***

### *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරං*

| *පරිච්ඡේදය 10 - ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි සහා නව රෙගුලාසි* |
|---|

**(a)** <u>පාරිභෝගික කටයුතු අධිකාරියේ අරමුණු</u>

- පාරිභෝගිකයන්ගේ ජීවිතයට හා දේපළවලට හානිදායක වන භාණ්ඩ අලෙවි කිරීමෙන් හෝ සේවා සැපයීමෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අභිරුචිය කෙරෙහි නිසි අවධානය යොමු කරන යුතු බවට සහතික වීම.
- හැකි සෑම විටම පාරිභෝගිකයින්ට තරඟකාරී මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවා සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම.
- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමාකාරී වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙඳුන් විසින් පාරිභෝගිකයන් හසුරුවන වෙනත් හානිකර ආකාරයකට එරෙහිව වන්දි ලබා දීම සම්බන්ධව සොයා බැලීම.

***(ලකුණු 04)***



aat SRI LANKA

**(b)**
පරිගණක අපරාධ හඳුනාගැනීම සඳහා සහ එම අපරාධ විමර්ශනය කිරීම සහ වැළැක්වීම සඳහා ක්‍රියා පටිපාටිමය විධිවිධාන සැලසීම සඳහා මෙම පනත හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටියදී මෙම පනත යටතේ වරදක් කරන පුද්ගලයෙකුට මෙම පනතේ විධිවිධාන අදාළ විය හැකිය. මෙම පනත යටතේ වරදක් වන ක්‍රියාව මගින් බලපෑමට ලක්වූ හෝ බලපෑමට ලක් විය හැකි වන්නා වූ පරිගණකය, පරිගණක පද්ධතිය හෝ තොරතුරු එයට වැදගත් වන අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තිබුණා වුවද මෙම පනත අදාල වේ.

***(ලකුණු 03)***

**(c)**
පහත ක්‍රියාවන් පනත යටතේ වන වැරදි ලෙස හඳුනා ගනු ලබයි.

- පරිගණකයකට අනවසර ප්‍රවේශය සිදු කිරීම සහ අනවසර ප්‍රවේශය සුරක්ෂිත කිරීම.
- අපරාධයක් සිදු කිරීම සඳහා පරිගණකයට අනවසරයෙන් ඇතුළුවීම සහ අපරාධයක් සිදු කිරීම සඳහා පරිගණකයේ අනවසර ප්රවේශය සුරක්ෂිත කිරීම.
- ඕනෑම පරිගණකයක ඇති ඕනෑම තොරතුරක් විනාශ කිරීම, මකා දැමීම හෝ වෙනස් කිරීම හෝ එකතු කිරීම, වෙනත් ස්ථානයකට ගෙන යාම හෝ වෙනස් කිරීම.
- හැකර් පද්ධති භාවිතයෙන් ප්‍රවේශ වීමට අවසර නොමැති මූලාශ්‍රවලින් දත්ත ලබා ගැනීම.
- පරිගණක මගින් සිදු කරන අපරාධවලට අනුබල දීම සහ කුමන්ත්‍රණය කිරීම.

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

***හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

| ***පරිච්ඡේදය 08 - රක්ෂණ නීතිය කුලී සින්නක්කර සහ කල් බදු*** |
|---|

**(a)**
භාණ්ඩවල හිමිකාරිත්වය වෙනස් කිරීමට අදාළ නීතිරීතිවලට අදාළව මෙම අවස්ථාව අදාල වේ. දර්ශි යශෝ සමග ඇති කර ගත් ගිවිසුමේ, භාණ්ඩවල හිමිකාරිත්වය වෙනස් කිරීමට අදහස් කරන චේතනාවක් සම්බන්ධයෙන් පැහැදිලිවම එකඟ වී නොමැති බව පෙනී යයි. ඒ අනුව, මෙහිලා භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 19 වැනි වගන්තියේ හිමිකාරිත්වය වෙනස් කිරීම සම්බන්ධයෙන් නියම කර ඇති රීති විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ.

මෙහිදී මෙම සීනි තොගය අයත් වන්නේ නිශ්චිත භාණ්ඩ ගණයටද නැතිනම් අවිනිශ්චිත භාණ්ඩ ගණයටද යන්න හඳුනා ගැනීම වැදගත්ය. යශෝගේ ගබඩාවේ දර්ශි විසින් මිලදී ගත් සීනි හැර වෙනත් සීනි තොගයක් පවතින අතර දර්ශි විසින් මිලදී ගන්නා ලද සීනි තොගය මුළු සීනි තොගයෙන් වෙන් කර ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැත. ඒ අනුව සීනි තොගය නිශ්චිත භාණ්ඩ ලෙස හඳුනාගත හැකිය.

භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 19 වැනි වගන්තියේ 05 වන රීතිය මඟින් අවිනිශ්චිත හෝ අනාගත භාණ්ඩ විකිණීම සඳහා වන ගිවිසුමක් ඇති විට, එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයේ ප්‍රකාශිත හෝ ව්‍යංග කැමැත්ත සහිතව භාණ්ඩ කොන්දේසි විරහිතව භාවිතා කරන තෙක් එම දේපලෙහි හිමිකාරිත්වය එම පාර්ශ්වය වෙත නොලැබේ.

මේ සම්බන්ධව විස්තර කළ හැකි නඩු තීන්දු වන්නේ Pignataro v Gilroy, Healy v Howlett & sons & East Port Navigation Corporation Case' වේ

Pignataro v Gilroy නඩුවේදී

පිග්නාටාරෝ පෙබරවාරි 27 වැනි දින ගිල්රෝයි වෙතින් සහල් මලු 140 ක් මිලදී ගැනීමේ අරමුණින් චෙක්පතක් යවා ඇති අතර, එය ලැබීමෙන් පසු ගිල්රෝයි විසින් නිකුත් කිරීමේ නියෝගයක් නිකුත් කර ඇත. ඇණවුමෙන් බෑග් 15 ක් ගිල්රෝයිගේ ව්‍යාපාරික පරිශ්‍රයේ තබා බෑග් 125 ක් ඉවත් කරන ලද අතර, එම බෑග මාර්තු 25 වන දින දක්වා පිග්නාටාරෝ විසින් ඉවත් කර නොගන්නා ලද අතර, එම දිනයේදී ගිල්රෝයිගේ කිසිදු නොසැලකිල්ලකින් තොරව සිටයදී එම ඉතිරි බෑග් සොරකම් කිරීමට භාජනය වන ලදී. පිග්නාටාරෝ ගිල්රෝයිගෙන් හානියක් ඉල්ලා ගිල්රෝයිට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරන ලදී. එම බෑග් 15 කොන්දේසි විරහිතව ගිවිසුමට අන්තර්ගතව ඇති බව අධිකරණය විසින් තීරණය කළ අතර, ඒ වන විටත් භාණ්ඩවල හිමිකාරිත්වය පිග්නාටාරෝ වෙත ලැබී බැවින් ගිල්රෝයිට එරෙහිව කිසිදු නඩු නිමිත්තක් නොපවතී.

ලබා දී ඇති අවස්ථාවේදී, දර්ශි විසින් මිලදී ගන්නා ලද සීනි තොගය ගිවිසුම සඳහාම වෙන් කර වෙනම තබා ගත් බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින් මිලදී ගත් සීනි තොගයේ දේපල හෝ හිමිකාරිත්වය දර්ශි වෙත නොලැබුණි. ඉහත කරුණු සලකා බැලීමෙන් සීනි වලට සිදු වූ පාඩුව යශෝට දැරිය යුතු බව කිව හැකිය. මුදල් ආපසු ඉල්ලීමට සහ පරිප්පු තොගය ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට දර්ශිට නීත්‍යානුකූල අයිතියක් ඇත. එබැවින් යශෝ නැවත මොහාන්ට මුදල් දීමට බැඳී සිටිනු ලබයි.

***(ලකුණු 06)***

**(b)**

මුල් ගැනුම්කරුට සාපේක්ෂව 2 වන ගැනුම්කරු භාණ්ඩ සඳහා වඩා හොඳ හිමිකමක් ලබා ගන්නා පහත සඳහන් අවස්ථා වලදී නොගෙවූ විකුණුම්කරුවෙකුට භාණ්ඩ නැවත විකිණීමට අවසර ඇත.

I. භාණ්ඩ ඉක්මනින් නරක් වන ස්වභාවයක් ඇති විට

එනම් එළවළු, මාළු හෝ පළතුරු

II. නැවත විකිණීමේ අයිතිය රඳවා තබා ගනිමින් භාණ්ඩ විකුණා ඇති විට

III. විකුණුම්කරු නැවත විකිණීමට අදහස් කරන බව ගැනුම්කරුට දැනුම් දී ඇති අවස්ථාවකදී සහ එවැනි දැනුම් දීමකින් පසුව පවා, ගැණුම්කරු සාධාරණ කාලයක් තුළ ගෙවීම් සිදු නොකරන්නේ නම්

එවැනි නැවත විකිණීමක දී දෙවන ගැනුම්කරු පළමු ගැනුම්කරුට වඩා හොඳ හිමිකමක් ලබා ගනී

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

***B කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 25 කි)

C කොටස

## හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 02 - ගිවිසුම් නීතිය*

**(A)**

**(a)**

මෙම කාරණය සම්බන්ධයෙන් තැපැල් රීතිය අදාළ වේ.

සාමාන්‍ය රීතිය වනුයේ ප්‍රතිග්‍රහණය බලාත්මක වනුයේ එය අර්පණකරුට නිල වශයෙන් දැනුම් දීමෙන් පසුව බවයි. ගිවිසුම සම්පූර්ණ වන්නේ ප්‍රතිග්‍රහණය අර්පණකරුට දැනුම් දීමෙන් පසුව පමණි.

කෙසේ වෙතත් තැපැල් ගිවිසුම් සාමාන්‍ය රීතියට ව්‍යතිරේකයකි.

ප්‍රතිග්‍රහණය තැපැල් මගින් සන්නිවේදනය කිරීමට පාර්ශවයන් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් එකඟ වී ඇත්නම්, එම ලිපිය ප්‍රමාද වී හෝ තැපෑලේදී නැති වුවද, ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කරන විට ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වන බව රීතිය වේ.

ඉහත කී න්‍යාය Adams V Lindsay රීතිය ලෙසින්ද හඳුන්වනු ලබයි.

මෙම නඩුවේදී ගිනිකන මහතා 12 වන සඳුදා උදෑසන තම මෝටර් රථය කල්පනා මහත්මියට විකිණීමට අර්පණය කරන ලදී. එදිනම කල්පනා මහත්මිය ඇයගේ ප්‍රතිග්‍රහණය තැපැල් කරන ලදී. ලිපිය A වෙත 14 වැනි බදාදා දින ලැබිණි. කෙසේ වෙතත් ගිනිකන මහතා මෝටර් රථය විල්ෆර්ඩ් මහතාට විකුණා ඇත්තේ 13 වැනි අඟහරුවාදාය. සැප්තැම්බර් 5 වැනිදා පිළිගැනීමේ ලිපිය තැපැල් කළ වහාම ගිවිසුමික බන්ධනයක් ඇති වී ඇති බවට අධිකරණය විසින් තීන්දු කරන ලදී.

ලබා දී ඇති කරුණු අනුව පදනම්ව, කල්පනා මහත්මිය 12 සඳුදා ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කර ඇත. එබැවින් එම දිනයේම ගිනිකන මහතා සහ කල්පනා මහත්මිය අතර වලංගු තැපැල් ගිවිසුමක් ඇති වී ඇත.

ඒ අනුව වලංගු ගිවිසුමක් තිබියදී විල්ෆ්‍රඩ්ට මෝටර් රථය විකුණා ගිනිකන මහතා ගිවිසුම කඩ කර ඇත. ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් ගිනිකන මහතාට එරෙහිව නඩු පැවරීමට කල්පනා මහත්මියට අයිතිය පවතී.

අතිරේක නඩු තීන්දු නීති

*Ceylon University* V *Fernando*

*Household Fire Carriage and Accident Insurance Company* V *Grant*

***(ලකුණු 05)***

**(b)**

ගිවිසුම් නීතියට අනුව, ගිවිසුමක් යනු නීතිමය සම්බන්ධතාවයක් ඇති කර ගැනීමේ අරමුණින් පාර්ශ්වයන් අතර ඇති වන එකඟතාවයක් ලෙසින් අර්ථ දැක්විය හැකිය. අර්පණය කොන්ත්‍රාත්තුවක මූලික අංගයක් වන අතර වලංගු අර්පණයක් නොමැතිව වලංගු ගිවිසුමක් නොමැත.

අර්පණය 'අර්පණය සඳහා වන ආරාධනයකින්' වෙන්කර හඳුනාගත යුතු වනුයේ, 'අර්පණය සඳහා වන ආරාධනයක් ප්‍රතිග්‍රහණය කිරීම මගින් කිසිදු වලංගු ගිවිසුමක් නිර්මාණය නොවන බැවිනි.

සාකච්ඡා කිරීමට ඇති කැමැත්ත ප්‍රකාශ කිරීම අර්පණය සඳහා වන ආරාධනයක් ලෙස හැඳින්වේ. තීරණය කරන ලද නඩු මාලාවක් මගින් ඒ බව දක්වා ඇති අතර සහ පහත නඩු තීන්දු අර්පණය සඳහා වන ආරාධනයන් සඳහා උදාහරණයන් වේ-

- වෙළඳ දැන්වීමක් (Harris V Nikerson, Partridge v Crittenden)
- වෙන්දේසි මගින් විකිණීම (Payne v Cave)
- ටෙන්ඩර් කැඳවීම (Spencer v Harding)
- වෙළඳ සැලක විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබා ඇති භාණ්ඩ (Fisher V Bell, Crawly v Rex)
- සංස්ථා ප්‍රකාශය

ලබා දී ඇති අවස්ථාවේදී, ගිනිකන මහතා විසින් අධිකරණ පරිශ්‍රයේ දැන්වීම් පුවරුවේ දැන්වීමක් පළ කරන ලදී. මෝටර් රථය විකිණීමට අදාළව පළ කර ඇති දැන්වීම " ගිවිසුමට ඇතුළත් වීම සඳහා/අර්පණය සඳහා වන ආරාධනයක් " ලෙස හඳුනාගත හැකි අතර එය අර්පණයක් නොවේ. ඒ අනුව, පොඩි මැණිකේ මහත්මියගේ තැපැල් පත මෙම සිදුවීම් මාලාවේ හඳුනාගත හැකි අර්පණය ලෙස සැලකිය හැකිය. තැපැල් පතක් මගින් පොඩි මැණිකේ මහත්මිය විසින් කරන අර්පණය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ගිනිකන මහතාට හැකිය. පොඩි මැණිකේගේ යෝජනාව සම්බන්ධයෙන් ගිනිකන මහතා විසින් වලංගු ප්‍රතිගහණයක් සිදු කර නොමැත. එබැවින් ගිනිකන මහතා සහ පොඩි මැණිකේ මහත්මිය අතර වලංගු ගිවිසුමක් නොමැත.

***(ලකුණු 05)***

**(c)**

ගිනිකන මහතා මෝටර් රථය විල්ෆ්‍රඩ්ට විකිණීමට එකඟ වන විට දෙපාර්ශවයේම අනුදැනුමකින් තොරව තැපැල් ගිවිසුම මගින් මෝටර් රථයේ අයිතිය කාංචනා මහත්මියට පැවරී තිබුණි. ඒ අනුව ගිනිකන මහතා සහ විල්ෆ්‍රඩ් මහතා අතර ඇතිකරගත් ගිවිසුම වැරදීමකින් සිදුවූවක් බවට නිගමනය කළ හැක.

ගිවිසුමේ නියමයන් පිළිබඳ වැරදි අවබෝධයක් හෝ ඇතැම් කරුණු සත්‍ය බවට ගිවිසුමට එළඹීමේදී ඇතිවන වැරදි විශ්වාසයක් වරදක් ලෙස අර්ථ දැක්විය හැක. ප්‍රධාන වරදක් සිදු වූ විට අර්පණය සහ ප්‍රතිග්‍රහණය සඳහා ලබා දී ඇති කැමැත්ත ස්වයංක්‍රීයව අව්‍යාජ නොවන බවට පත් වන අතර එම හේතුව මත පිහිටා ගිවිසුම ශුන්‍ය කළ හැකිය.

ගිවිසුම කිසිදා නිර්මාණය කර නොතිබූ බැවින්, ගිවිසුම ඇති කරන විට කිසිම පාර්ශ්වයකට එය බලාත්මක කළ නොහැකිය. එබැවින්, කිසිදු පාර්ශ්වයකට කිසිදු අයිතියක් බලාත්මක කිරීමට හෝ ගිවිසුමේ දක්වා ඇති වගකීම් ඉටු කිරීමට නොහැකිය.

ඒ අනුව විල්ෆ්‍රඩ්ට මෙම ගිවිසුම යටතේ කිසිදු අයිතියක් හෝ වගකීමක් නොමැති වේ.

***(ලකුණු 05)***

***පරිච්ඡේදය 07 - කම්කරු නීතිය***

**(B) (a)**

**1. පාලන පරීක්ෂණය**

සේවකයා සේවා යෝජකයාගේ පාලනයට යටත් වන ප්‍රමාණය අනුව ඔහු සේවකයෙකුද ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකුද යන්න තීරණය වේ. යම් පුද්ගලයෙකු යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින අතරතුර සේවා යෝජකයෙකුට විනය පාලනය කළ හැකි විට ඔහු සේවකයෙකු ලෙස හඳුනා ගැනේ. විනය යන්නෙන් අදහස් කරන්නේ වැඩ ආරම්භ කරන කාලය, නිවාඩු, සේවකයා විසින් ඉටු කළ යුතු රාජකාරි, කාල පරතරයන්, වැඩ අවසන් කරන කාලය, සේවකයින්ගේ උසස්වීම් සහ තනතුරින් පහත හෙළීම් පිළිබඳ සම්මත කිරීම වේ.

**2. උපකරණ පරීක්ෂාව**

ඇතැම් විට, පාලනයට යටත් නොවන පුද්ගලයෙකු පවා සේවකයෙකු විය හැකිය. එබැවින්, තවදුරටත් භාවිතා කළ හැකි පරීක්ෂණයක් වන්නේ උපකරණ පරීක්ෂණයයි. මෙයින් අදහස් කරන්නේ සේවා සැපයීම සඳහා අවශ්‍ය උපකරණ සේවායෝජකයා විසින් සපයනු ලබන බවයි. එවැනි අවස්ථාවක ඔහු සේවකයෙකු ලෙස සලකනු ලැබේ.

**3. ඒකාබද්ධතා පරීක්ෂණය**

සේවකයෙකු වෙන් කළ නොහැකි ආකාරයෙන් ව්‍යාපාරයට සම්බන්ධ වී ඇත්නම් හෝ ව්‍යාපාරයේ කොටසක් ලෙස සලකන්නේ නම්, ඔහු ව්‍යාපාරයේ සේවකයෙකු ලෙස සැලකේ. එනම්, එම පුද්ගලයා විසින් ව්‍යාපාරයට සපයන සේවාව අමතර උපාංගයක් නොවිය යුතු අතර එය ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යයක් විය යුතු වේ.

**4. ආර්ථික සත්‍යතා පරීක්ෂණය**

මෙහිදී, ගිවිසුම්ගත බැඳීමේ අවසාන ප්‍රතිලාභය කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම පරීක්ෂණයට අනුව, පුද්ගලයෙකු තමා වෙනුවෙන් සේවය කරන්නේ නම්, එනම් අවසාන ඍජු ප්‍රතිඵලය ඔහු විසින් ලබා ගන්නේ නම්, ඔහු ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු වන අතර අවසාන ප්‍රතිඵලය සේවාව සපයන සමාගමට ලැබෙන්නේ නම්, ඔහු එම ආයතනය වෙනුවෙන් සේවය කරන සේවකයෙකු වේ.

**5. බහු පරීක්ෂණ/ මිශ්‍ර පරීක්ෂණය**

වර්තමානයේදී, අධිකරණයන් විසින් ඉහත සඳහන් කළ පරීක්ෂණ වෙන වෙනම සලකා බලනු නොලබන අතර පුද්ගලයෙකු සේවා ගිවිසුමක් මගින් ආවරණය වන ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකුද නැතහොත් සේවා ගිවිසුමෙන් ආවරණය වන සේවකයෙකුද යන්න සලකා බලන විට පාලන පරීක්ෂණය අනෙකුත් පරීක්ෂණ හා සමග එක්ව භාවිතා වේ.

***(ලකුණු 05)***

**(b)**

සීමාසහිත සුරක්ෂා සහ ෂුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම අතර සම්බන්ධතාවයේ ස්වභාවය පැහැදිලි කරමින් නිගමනයකට එළඹීමට, කම්කරු නීතියේ "සේවකයෙකු සහ ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු අතර වෙනස්කම් හඳුනා ගැනීම" යටතේ "බහු පරීක්ෂණය" සම්බන්ධව සාකච්ඡා කිරීම අවශ්‍ය වේ.

පුද්ගලයෙකු සේවා කොන්ත්‍රාත්තුවක් මගින් ආවරණය වන ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකුද නැතහොත් සේවා කොන්ත්‍රාත්තුවක් මගින් ආවරණය වන සේවකයෙකුද යන්න සලකා බලන විට, පාලන පරීක්ෂණය, උපකරණ පරීක්ෂාව, ඒකාබද්ධතා පරීක්ෂණය සහ ආර්ථික යථාර්ත පරීක්ෂණය යන පරීක්ෂණ බහුවිධ පරීක්ෂණයේදී එක්ව භාවිතා කරනු ලබයි.

ඉහත කී පරීක්ෂණය Sri Lanka Insurance Corporation V A.C.R Wijesundara නඩුවේදී අදාල කර ගනු ලැබීය.

මෙහිදී ගැටලුව වූයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කළ තක්සේරුකරුවෙකුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් වන අතර මෙහිදී අධිකරණයේ අවධානය යොමු කරන ලද්දේ ඔහු ස්වාධීන කොන්ත්රාත්කරුවෙක්ද නැතහොත් සේවකයෙක්ද යන්න වෙතයි. එහිදී අධිකරණය පහත කරුණු එක්ව සලකා බැලූ අතර ඔහු රැකියා ගිවිසුමක් යටතේ ආවරණය වන සේවකයෙකු බවට නිගමනය කරන ලදී.

- පාර්ශ්වයන් අතර ඇති කර ගත් ගිවිසුමට අනුව, තක්සේරුකරු රක්ෂණ සමාගමේ ප්‍රතිලාභය සඳහා කටයුතු කිරීමට බැඳී සිටි අතර ඔහු එසේ කටයුතු නොකරන විට රැකියාව අවසන් කිරීමට රක්ෂණ සමාගමට හැකියාව ඇත.

- තක්සේරුකරු සේවා සපයන්නේ අතිරේක උපාංගයක් ලෙස නොව, ව්‍යාපාරයේ අනිවාර්ය කොටසක් ලෙසින් වීම.

- තක්සේරුකරු සෑම දිනකම පෙරවරු 9.30 ට පෙර ඉහළ නිලධාරීන් වෙත වාර්තා කළ යුතුය.

- රක්ෂණ සමාගම තක්සේරුකරුට සහ රක්ෂණ සමාගමට උපකරණ ලබා දීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රවාහන හා මුද්‍රණ වියදම් දැරීම

ප්‍රශ්නයේ ලබා දී ඇති සිදුවීම ඉහත නඩු තීන්දුවට බොහෝ සමාන වේ.

**සුරක්ෂා** සහ **ෂුවර් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** සමග එළඹෙන ලද ගිවිසුමට අනුව,
- ෂුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි ප්‍රයෝජනය සඳහා වැඩ කිරීමට සුරක්ෂා බැඳී සිටින ලදී. එසේ කිරීමට අපොහොසත් වුවහොත් රැකියාව අවසන් කිරීමට සමාගමට හැකියාව ඇත.

- සුරක්ෂා සෑම දිනකම පෙරවරු 9.30ට පෙර කාර්යාලයට වාර්තා කළ යුතුය.

- ෂුවර් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් විසින් තක්සේරුකරුවන්ට අවශ්‍ය සියලුම උපකරණ සපයා ඇති අතර තක්සේරු කිරීම් සිදු කිරීම සම්බන්ධව වන ප්‍රවාහනය සහ අනෙකුත් අදාළ වියදම් නැවත ගෙවන ලදී.

**සුරක්ෂා** සහ **ෂුවර් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** ගිවිසුමට අදාළ කරුණු සලකා බැලීමේදී, බහුවිධ පරීක්ෂණය යොදා ගැනීම මගින් **සුරක්ෂා ඉන්ෂුවරන්ස් ලිමිටඩ්හි** සේවකයෙකු වන බවට ප්‍රකාශ කළ හැකිය.

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 25)***

SRI LANKA

***C කොටසෙහි අවසානය***

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*